**ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 262 - මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ප්‍රකාශ කරමි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 කට අයත් ඉඩම් හෙක්ටයාර් 29.6537 ක භූමි ප්‍රමාණයක් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | අකුරැස්ස,අතුරලිය, පස්ගොඩ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉඩම්වලට අදාල තක්සේරු වාර්තා ලැබීමෙන් පසු ගිණුම්ගත කරන බව. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව වත්කම් තක්සේරු කර ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 ක 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම්, ගොඩනැගිලි හා වාහනවල වටිනාකමට අදාලව සිගාස් වාර්තාව හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඉදිරිපත් කර තිබුණු වාර්තාව අනුව රු.341,407,290 ක වෙනසක් නිරීක්ෂණය විය. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 7 හි ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් සිගාස් වාර්තාව අනුව හා කොම්ප්ට්‍රෝලර් ජනරාල් වාර්තාවේ අඩු අගයක් සහිතව පැවති බැවින් අඩුපාඩුව නිවැරදි කර සිගාස් වාර්තාවට අනුකූලව සකස් කර පරස්පරතාවයන් නිවැරදි කිරීමට කටයුතු කළ බව. | වාර්තා අතර සැසඳීමක් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති හා අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය විෂයයන් 08 කට අදාලව එකතුව රු. 3,013,739 ක බැරකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2කට අදාළ එකතුව රු. 26,174 ක් ද සමඟ එකතුව රු. 3,039,913 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු | ඉදිරි වර්ෂයේදී දෙසැම්බර් මාසයට අදාල සියලුම වවුචර්පත් බැරකම් ලේඛනයට ඇතුලත් කිරීමට හැකිවන පරිදි ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරින්ට උපදෙස් දීමට කටයුතු කළ බව. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

නව සිගාස් මගින් ජනනය කරන ලද බැදීම් හා බැරකම් යටතේ වාර්තා කර නොතිබුණි.

## 2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලයට අයත් රියැදුරෙකු සහ රිය සහායකවරයෙකු 2017 වර්ෂයේදී නුපේ පිහිටි ජාතික ජල සම්පාදන මණ්ඩලයට තාවකාලිකව අනුයුක්ත කර තිබුණද 2020 නොවැම්බර් සිට අනුයුක්ත කිරීම සඳහා දිවි නැගුම අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමැතිය ලබා දී නොතිබුණි. එදින සිට 2023 මාර්තු 13 දින තෙක් අනුමැතියකින් තොරව මෙම සේවකයන් දෙදෙනාට වැටුප් හා දීමනා රු.2,509,533 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ වැටුප් අයකරගැනීමට පියවර ගෙන ඇති බව. | අවශ්‍ය අනුමැතියට අනුයුක්ත කිරීම් කළ යුතුය. |
| (ආ) | මාතර දිස්ත්‍රික් සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානයේ එක් කැබ් රථයක් පමණක් තිබියදී එම ආයතනයට රියදුරන් තිදෙනෙකු අනුයුක්ත කිරීම නිසා කිසිදු ඵලදායී සේවයක් ලබා නොගෙන 2020 සැප්තැම්බර් 21 හා 2022 නොවැම්බර් 28 දින බඳවා ගත් අතිරික්ත රියදුරන් දෙදෙනෙකුට 2023 ජූනි 30 දක්වා රු.1,976,230 ක වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණි. | අදාල නිලධාරීන් මාරු කිරීමට සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ඇති බව. | අතිරික්ත නිලධාරීන් සම්බන්ධයෙන් පියවර ගත යුතුය. |
| (ඇ) | ග්‍රාමීය හා පාසැල් ක්‍රීඩා, යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කළ ග්‍රාමීය ක්‍රීඩාපිටි සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දික්වැල්ල, අතුරලිය හා වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුල එකතුව රු.4,286,251ක් වැයකර ක්‍රීඩා පිටි 03ක් සංවර්ධනය කර තිබුණු අතර ක්‍රීඩා පිටි අරමුණුගත කාර්යයට යොදා ගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි. | පානීය ජලය, වැසිකිලි පහසුකම්,ඇඳුම් මාරු කිරීමට ස්ථානයක් නොමැති වීම හා වොලිබෝල් හා ක්‍රිකට් ක්‍රීඩා කිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම මත මෙම ක්‍රීඩා පිටියේ අරමුණු ඉටුකර ගැනීම ගැටළුවක් වී ඇති බව. | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන අයුරින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වේවැල්, පිත්තල,මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | |
| **(i)** | ග්‍රාමීය හා සම්ප්‍රදායික ඒකාබද්ධ වැඩසටහන යටතේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කියාඹුව හා ගලබඩහේන ග්‍රාම නිලධාරී වසම් වල බටපතුරු ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයේ, බට කර්මාන්තකරුවන් සඳහා රු.1,745,067ක් වැය කර වැඩහලක් ඉදිකර තිබුණද එම වැඩහල අදාල කාර්යයට යොදා නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. 2021 දෙසැම්බර් රු.338,443ක් වැයකර බට ආශ්‍රිත පොදු පහසුකම් මධ්‍යස්ථානයේ පොදු භාවිතය සඳහා වර්ග 26 ක් යටතේ උපකරණ අයිතම 208 ක් මිලදී ගෙන එම උපකරණ නිෂ්කාර්යයව ගබඩාකර තිබූ අතර යන්ත්‍රවල වගකීම් කාලය ඉක්ම ගොස් වසර 1 ½ ක් ගත වී තිබුණි. | ගොඩනැගිල්ලේ ආරක්ෂාව ප්‍රමාණවත් නොවන බැවින් සමහර භාණ්ඩ පෞද්ගලිකව නිවසේ තබා ඇති බවත්, විදුලි බලයේ පවතින ගැටළුවක් නිසා සමහර භාණ්ඩ භාවිතා නොකරන බව. | යටිතල පහසුකම් සංවර්ධනය කර මෙම ගොඩනැගිල්ල හා උපකරණ නිෂ්පාදනය කටයුතු වලට යොදා ගත යුතු ය. |
| (ii) | වැලිගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ කුඹල්ගම රතුමැටි ආශ්‍රිත නිෂ්පාදන ගම්මානයක් ආරම්භකර එක් ප්‍රතිලාභියෙකුට රු. 75,000ක් වශයෙන් ප්‍රතිලාභින් 19 ක් සඳහා එකතුව රු.1,425,000 ක් වටිනා ඉදිකිරීම් ද්‍රව්‍ය ලබා දී තිබුණද, භෞතික පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් එම ද්‍රව්‍ය අරමුණුගත කාර්යයන්ට යොදා ගෙන නොතිබුණි. | අමුද්‍රව්‍ය සොයාගැනීමට ඇති දුෂ්කරතාවය නිසා කර්මාන්තය තාවකාලිකව නතර වී ඇති අතර ප්‍රතිලාභීන්හට වැඩහල් ඉදිකිරීම සඳහා ලබා දුන් ද්‍රව්‍ය උපයෝගී කරගෙන නිවසට යාබදව ඉදිකිරීම් සිදු කර වෙනත් කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගන්නා බව. | ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුය. |
| (iii) | එක් ගමකට එක් ව්‍යවසායකයකු බිහි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී ප්‍රතිලාභීන් 83කට රු.4,906,540 ක රජයේ දායකත්වය යටතේ ලබා දුන් විවිධ උපකරණ ඌණ උපයෝජිතව හා නිෂ්කාර්යයව පැවතුණි. | ඌණ උපයෝජිත වත්කම් පිළිබඳ සොයාබලා ඉදිරි කටයුතු සිදුකරන බව. | මනා පසු විපරම් ක්‍රියාමාර්ගයක් මගින් නැවත ව්‍යාපෘතිය සක්‍රීය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර, මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන | | |
| (i) | අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් දෙකක පැල තවාන් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට ප්‍රතිලාභීන් 101කට එකතුව රු. 4,953,464 උපකරණ හා ද්‍රව්‍ය ලබා දී තිබුණි. එක් ග්‍රාම නිලධාරී වසමක තෝරාගත් ප්‍රතිලාභීන්ගෙන් 08කට බෙදා දෙන ලද රු. 403,670 ක් වටිනා ද්‍රව්‍ය හා උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. | ප්‍රතිලාභින් කිහිපදෙනෙකු පමණක් ව්‍යාපෘතිය සාර්ථකව සිදු කරගෙන යන බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රතිලාභීන්ට ඇති ගැටළු නිරාකරණය කිරීමට පියවර ගත යුතුය. |
| (ii) | වැලිපිටිය, වැලිගම හා කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 සඳහා සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර, මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලද එකතුව රු.3,884,150ක ප්‍රතිපාදන වැයකර සමෘද්ධි පවුල් 409 ක් සඳහා කිකිළි පැටවුන් 8972ක් ලබා දී තිබුණි. ඉන් රු.3,101,450ක් වටිනාකම සහිත කිකිළි පැටවුන් 7234ක් 2024 ජනවාරි මාසය වනවිට මියගොස් තිබුණි. තවද පැටවුන් මිය යාම හේතුවෙන් කොටපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රතිලාභින් 40කට කුකුල් කූඩු සෑදීම සඳහා ලබා දී තිබුණු රු.2,200,000ක මුදල ද නිශ්කාර්යය වී තිබුණි. | කිකිළි පැටවුන්ට දෙන ආහාර මිල ඉහල යාම, නඩත්තු කටයුතු සිදු කිරීමට නොහැකි වීම, නිලධාරීන්ගේ පසුවිපරම් නිසිපරිදි ක්‍රියාත්මක නොවීම හා ප්‍රතිලාභී උනන්දුව අඩුවීම වැනි හේතු නිසා ව්‍යාපෘතිය අසාර්ථක වී ඇති බව . | සෞඛ්‍ය සම්පන්න කිකිළි පැටවුන් ලබා ගැනීම දිරිමත් කරන ආකාරයට පසු විපරම් ක්‍රමවත් කරමින් ප්‍රතිලාභීන් නැවත ව්‍යාපෘතියට යොමු කරමින් ව්‍යාපෘතිය සාර්ථක කර ගත යුතුය. |
| (iii) | වැලිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එළවළු නිෂ්පාදන ගම්මානයක කොරටු ගොවීන් 65කට රු.4,929,000ක් වැයකර ජී.අයි.බට 930ක් බෙදා දී තිබුණද, එළවළු නිෂ්පාදන වගාව සම්පූර්ණයෙන් විනාශ වීම හේතුවෙන් ජී.අයි.බට | එළවළු නිෂ්පාදන ව්‍යාපෘතිය අයහපත් කාලගුණය හා භූමියේ පිහිටීම මත අසාර්ථක වූ බව. | ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිෂ්කාර්යයව තිබුණි. | | |
| (iv) | අතුරලිය, මුලටියන හා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03හි ග්‍රාම නිලධාරි වසම්වල පිළිවෙලින් බතික් නිෂ්පාදනය, කුරුඳු බෙල් කිරීම හා බට ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් 83කට රු.5,566,376ක වටිනාකම සහිත උපකරණ අයිතම 611ක් අදාළ කාර්යයන් සඳහා යොදාගැනීමකින් තොරව නිෂ්කාර්යයව පැවතුණි. තවද අතුරලිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බතික් නිෂ්පාදනයට මිලදීගෙන තිබුණු රු.524,480ක් වටිනා රසායනික ඩයි වර්ග නිෂ්පාදන කටයුතුවලට යොදානොගෙනම කල් ඉකුත් වී තිබුණි. | ඉදිරියේදී මේ තත්ත්වයන් මගහැරීමට පසුවිපරම් සිදුකරන බව. | පසුවිපරම් නිසි පරිදි සිදු කළ යුතු බවත් අදාළ සියළුම ප්‍රතිලාභීන් බතික් කර්මාන්තයට යොමුවීම දිරිමත් කළ යුතුය. |
| (v) | කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරි වසම් 02ක ප්‍රතිලාභීන් 30කට රු. 360,000 ක් වටිනා එනසාල් පැළ 3000 ක් ලබා දී තිබුණද වගා ව්‍යාපෘතිය අසාර්ථක වීම හේතුවෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ලැබී නොතිබුණි. | එනසාල් වගාව වද වී ඇති බව. | පසු විපරම් ක්‍රියාමාර්ග ක්‍රමවත් කිරීමත්,ප්‍රතිලාභීන් දැනුවත් කර ඔවුන් නිෂ්පාදන කටයුතුවලට යලි යොමුකිරීමත් කළ යුතුය. |
| (ඊ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක සමෘද්ධි ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ වැඩසටහන | | |
| (i) | මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සවිබල ගැන්විය හැකි සමෘද්ධි ප්‍රතිලාභී පවුල් 72 ක් සවිබල ගැන්වීමේ අරමුණින් රජයේ දායකත්වය ලෙස රු.2,848,900 ක් වැය කර ප්‍රතිලාභීන් වෙත උපකරණ ලබාදී තිබූ නමුත් එම ප්‍රතිලාභීන් සමෘද්ධි ප්‍රතිලාභ අඛණ්ඩව ලබා ගැනීම නිසා සවිබල ගැන්වීම යන අරමුණ ඉටු වී නොතිබුණි. | සමෘද්ධි ප්‍රතිලාභීන් සවිබල ගැන්වී නොමැති බවත්, එයට හේතු වී ඇත්තේ ආර්ථික අපහසුතා බව. | ප්‍රතිලාභීන්ගේ හැකියාව හඳුනාගෙන උපකරණ බෙදාදිය යුතු අතර මනා පසුවිපරම් ක්‍රියාමාර්ගයක් තුලින් ප්‍රතිලාභීන්ගේ උනන්දුව වර්ධනය කළ යුතුය. |
| (ii) | පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් 48ක් වෙනුවෙන් 2021 වර්ෂයේ දී | වසම්භාර අධීක්ෂණ නිලධාරීන්ගෙන් පසු විපරම් කටයුතු නිසි පරිදි සිදු නොවූ නිසා මේ තත්ත්වය ඇති වී | මනා පසුවිපරම් ක්‍රියාමාර්ගයක් තුලින් |

| | | | |
|---|---|---|---|
| | රු. 2,127,093 ක රජයේ දායකත්වය යටතේ තේ පැල හා උපකරණ ලබා දී තිබුණි. ප්‍රතිලාභීන්ගෙන් සියයට 71ක් 2023 වර්ෂය දක්වාම සමෘද්ධි ප්‍රතිලාභ ලබා ගැනීම හේතුවෙන් ඔවුන් සවිබල ගැන්වීමේ අරමුණ ඉටුවී නොතිබූ අතර දරන ලද රු.2,127,093 ක වියදම ඵලදායී වී නොතිබුණි. | ඇති බව. | ප්‍රතිලාභීන්ගේ උනන්දුව වර්ධනය කළ යුතුය. |
| (උ) | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක සමෘද්ධි අරුණළු ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය | | |
| (i) | මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 3ක ප්‍රතිලාභීන් 106ක් සඳහා ලබා දුන් කුරුඳු පැල 12,703න් රු.783,120 ක් වටිනා පැල 9785ක් නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. | පැවති නියඟය හේතුවෙන් පැල විනාශ වී ඇති බව. | සමස්ත ව්‍යාපෘතියම සම්බන්ධ පසු විපරම් කටයුතු ක්‍රමවත් කල යුතුය. |
| (ii) | මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ප්‍රතිලාභීන් තිදෙනෙක් වෙත ලබාදුන් එකතුව රු. 705,001 ක් වටිනා කිරිගවයන් හතර දෙනෙකුගෙන් තිදෙනෙකු ප්‍රතිලාභ ලැබීමට පෙර මියගොස් තිබූ අතර, තවත් කිරි ගවයකු වසර 1 මාස 06 ක් ගතවී තිබුණද පැටවුන් බිහිකර නොතිබුණි.ඒ අනුව ගවයින් වෙනුවෙන් රජය විසින් දරන ලද වියදම ආර්ථික නොවන ගනුදෙනුවක් විය. | සතුන් මිය ගොස් ඇති බව. | සතුන් ලබා දීමේදී නිරෝගී සතුන් ලබා දීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | ජනාධිපති කාර්යාල වැය ශිර්ෂ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම ශක්ති පලමු අදියරේ සහ දෙවන අදියරේ සමිති 09 ක් අක්‍රීයව පැවති අතර 2023 මාර්තු 31 දිනට එම සමිති ගිණුම්වල රු. 3,560,430 ක මුදලක් අක්‍රීයව පැවතුණි. | සමිති සක්‍රීයව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | අක්‍රීය සමිති සතු මුදල් පවරා ගැනීමට හෝ එම සමිති සක්‍රීය කිරීමට පියවර ගත යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම<br><br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ නිර්දේශය අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | xix පරිච්ඡේදයේ 5 ඡේදය | 157,141 | රජයේ නිවාසයක පදිංචි අකුරැස්ස සහකාර ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් 2021 දෙසැම්බර් සිට 2023 දෙසැම්බර් දක්වා කාලයට අදාළ නිවාස කුලී අයකරගෙන නොතිබුණි. | සහකාර ප්‍රාදේශීය ලේකම් නිල නිවාසය ලෙස උපලේඛණගත කිරීමට ඉල්ලුම් කර ඇති අතර ඉල්ලීමට ලැබෙන පිළිතුර අනුව අයකිරීම් සිදු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි නිවාස කුලී අය කරගත යුතුය. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 2. iv ඡේදය | 275,548 | කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී හා අනෙකුත් නිලධාරීන් 13 දෙනෙකු විසින් 2023 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීමකින් තොරව නිවාඩු දින වැටුප් හා අතිකාල දීමනා ලබා ගෙන තිබුණි. | ඉදිරියේදී මේ තත්ත්වය ගැන සොයා බලා කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරන ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලාගත් ග්‍රාම නිලධාරී වසම් 4ක අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විධිමත් පියවර ගෙන නොතිබූ අතර ඉඩම් නියෝග අංක 180 පරිදි ග්‍රාම නිලධාරී වසම් 33 ක ග්‍රාම නිලධාරීන් විසින් අනවසර ඉඩම් අල්ලා ගැනීම් සම්බන්ධයෙන් ලේඛණයක් පවත්වාගෙන ඒ පිළිබඳ දෙසති වාර්තා ප්‍රාදේශීය ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අනවසර අල්ලා ගැනීම් නියමානුකූල කර ඇති අතර දෙසති වාර්තා ඉදිරිපත් කිරීමට ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක එකතුව රු. 14,647,262 ක් වූ වසර 02 ඉක්ම වූ තැන්පතු ශේෂ 111 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | තැන්පතු නිදහස් කිරීම සඳහා අදාල අංශ දැනුවත් කළ බව. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 අගෝස්තු 20 දිනැති අංක 2008/04 දරණ ඉඩම් කොමසාරිස්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ඉඩම් නියමානුකූල කිරීම සඳහා පස්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 22 ක පසුගිය වසර 04 තුළ ඉඩම් කච්චේරි පවත්වා නොතිබූ අතර පර්චස් 1070 කට අදාළව පදිංචිකරුවන් 10කගේ දීර්ඝ කාලීන බදුකර සකස් කිරීමට පසුගිය වසර 03 ක කාලය තුල පියවර ගෙන නොතිබුණි. | අදාල ආයතනවලින් අනුමැතිය ලද පසු පැවරීම් සිදු කරන බව. | කඩිනමින් දීර්ඝ කාලීන බදුකර සකස් කර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කිරින්ද පුහුල්වැල්ල , කඹුරුපිටිය, මාලිම්බඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල පදිංචිකරුවන් 79 ක් රජයේ ඉඩම් අනවසරයෙන් භුක්ති විඳිනු ලැබුවද ඒවා පසුගිය වර්ෂ 02 ක සිට වර්ෂ 16ක් අතර කාලය තුළ නියමානුකූල කිරීමට පියවර ගෙන නොතිබුණි. | ඉඩම් කොමසාරිස්ගෙන් අනුමැතිය ලද පසු පැවරීම් කටයුතු සිදු කරන බව. | අනුමැතිය කඩිනමින් ලබා ගෙන පැවරීම් කටයුතු නිම කළ යුතුය. |

## 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඌණ සංවර්ධිත දහම් පාසල් වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ රු.250,000 ක් වැයකර දහම් පාසලක ඌණතා සහිතව ඉදි කරන ලද වැසිකිලි පද්ධතියේ අනුමත සැලැස්ම, අනුමැතියෙන් තොරව වෙනස් කර තිබූ අතර, ඉටු නොකළ වැඩ විෂයයන් 05ක් සඳහා රු.28,670 ක මුදලක් ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2023 අගෝස්තු 10 වන විටත් සම්පූර්ණයෙන් වැඩ අවසන් නොකිරීමේ හේතුව මත එම වැසිකිලි පද්ධතිය භාවිත කළ නොහැකි තත්ත්වයේ පැවතුණි. | අනුමැතිය ලබා නොගත් බවත් රැඳවූම් මුදල් නිදහස් කර නොමැති බව. | ඇස්තමේන්තු වෙනස් කිරීමේදී පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර වියදම් කළ මුදලට අදාළව ප්‍රතිඵල ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් නිල නිවස අලුත්වැඩියා කිරීමට වැඩ විෂයන් 25 ක් සඳහා රු.724,924 ක වටිනාකමකට ගිවිසුම්ගතව ප්‍රමාණ පත්‍ර පිළියෙළ කිරීමෙන් තොරව රු.722,975 ක් ගෙවීම් කර තිබුණි. අනුමත ඇස්තමේන්තුවේ සඳහන් රු.281,271 ක් වටිනා වැඩ විෂයයන් 10 ක් ඉටුකර නොතිබුණු අතර ඇස්තමේන්තුවේ සඳහන්ව නොමැති රු.183,594 ක් වටිනා වැඩ විෂයයන් 10 කට ගෙවීම් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13 ඡේදය ප්‍රකාරව අත්හැරි වැඩ, වෙනස් කිරීම් හා අතිරේක වැඩ සඳහා අනුමැතිය ලබා නොගෙන වැඩ විෂයයන් 14 කට ගෙවීම නිසා ඇස්තමේන්තුව හා අවසන් බිල්පත අතර රු.180,092 ක වෙනසක් පැවතුණි. | ගිවිසුම් ගත වී ඇත්තේ අනුමත ඇස්තමේන්තුවට බවත් ඉටුකළ වැඩ කොටස්වල අනුමත ඇස්තමේන්තුවේ වැඩ කොටස් නොමැති බව. | ගිවිසුම් ගතවූ අනුමත ඇස්තමේන්තුවේ වැඩ කොටස් ඉටු කළ යුතුය. |

### 3.3 වත්කම් කළමණාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුලටියන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසමක වසා දමන ලද පාසලක් නවීකරණය කර එම පාසල තුල කුරුඳු නිෂ්පාදනයට අවශ්‍ය පුහුණු පාඨමාලා පැවැත්වීම හා ඊට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රු.6,905,652 ක් වැයකර අදාල ගොඩනැගිල්ල නවීකරණය කර උපකරණ මිලදී ගෙන තිබුණි. මීට ආසන්න ස්ථානයක රජය මගින් කුරුඳු පර්යේෂණායතනයක් පවත්වාගෙන යන බැවින් මෙම ගොඩනැගිල්ල හා උපකරණ ඌණ උපයෝජිතව පැවතුණි. | රටේ පවතින ගැටළුකාරී තත්ත්වය මත ප්‍රතිපාදන නොලැබීමත් පලොල්පිටියේ පුහුණු මධ්‍යස්ථානයක් පැවතීමත් වැනි හේතූන් නිසා අපේක්ෂිත පරිදි පුහුණු පාඨමාලා සිදු කිරීමට නොහැකි බව. | අදාල ගොඩනැගිල්ල සුදුසු කටයුත්තක් වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |
| (ආ) | 2022 වසරේදී ගම සමග පිළිසඳරක් වැඩසටහන යටතේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සේවා පියස ඉදිකිරීම සඳහා රු.1,164,957ක මුදලක් වැයකළ ද සේවා පියසෙහි වැසිකිළිය සඳහා ජල සැපයුම සම්බන්ධ නොකිරීම නිසා වසරකට අධික කාලයක සිට ඌණ උපයෝජිතව පැවතුණි. | සේවා පියස ඉදිකිරීම සම්බන්ධව ප්‍රගතිය වාර්තා කරන බව. | යටිතල පහසුකම් සම්පූර්ණ කර ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) | ගම සමග පිළිසඳරක් වැඩ සටහන යටතේ අතුරලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගොවි සංවිධානයක් සඳහා ලබාදී තිබුණු රු.230,000ක් වටිනා කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය කසල කැබලි කිරීමේ යන්ත්‍රයක් ඉකුත් වසර 1 ½ක පමණ කාලය තුලම ගොවි සංවිධාන ලේකම්ගේ නිවසේ ඌණ උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී කාබනික පොහොර නිෂ්පාදනයට යොමුකරන බව. | යන්ත්‍රය අරමුණ සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 104(4) හා 156(1) ප්‍රකාරව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක වසර 05 ක සිට වටිනාකම රු. 246,275 ක් වූ හානි හා පාඩු සම්බන්ධව කටයුතු අවසන් කර නොතිබුණි. | කඩිනමින් එකී වාර්තා ලබාගෙන කටයුතු අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. | හානි හා පාඩු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කඩිනමින් පියවර ගත යුතුය. |

## 3.5 කළමණාකරන දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 මැයි මස 25 දිනැති 1759/44 ගැසට් පත්‍රය හා 2017 ජනවාරි 26 දිනැති 2003/29 දරණ ගැසට් පත්‍රය මගින් තිහගොඩ හා දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයන්හි පිළිවෙලින් පෞද්ගලික ඉඩම් හෙක්ටයාර් 2.18996 ක් හා රූඩ් 01 පර්චස් 1.092 ක් පවරා ගෙන ඉඩම් නොමැති පුද්ගලයින්ට ලබා දීමට තීරණය කර තිබුණි. ඒ අනුව ඔවුනට ගෙවිය යුතු රු.8,597,150 ක් වූ මුළු වන්දි මුදල නිසි පරිදි නොගෙවීම නිසා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 460 පරිච්ඡේදයේ 261(4) වගන්තිය ප්‍රකාරව රු.3,238,980 ක අතිරේක පොළියක් ගෙවීමට සිදු වී තිබුණි. | ලේඛණ වල පැවති අඩුපාඩු හේතුවෙන් මේ තත්ත්වය ඇති වී ඇති බව. | නිලධාරීන්ගේ රාජකාරී අතපසුවීම හේතුවෙන් රජයට සිදුවන පාඩු අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටුවිට I ග්‍රාමනිලධාරී වසමේ පර්චස් 8.78 ක ඉඩම රජයට පවරාගැනීමකින් තොරව රු. 2,903,630 ක් වැයකර සේවා පියසක් ඉදිකර තිබුණද ඉඩම රජයට පවරා නොගැනීම නිසා යටිතල පහසුකම් සංවර්ධනය යන අරමුණ ඉටු වී නොතිබුණි. | අත්පත් කර ගැනීම් සිදු කර නොමැති බව. | ඉඩම අත්පත් කර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ඇ) | ග්‍රාම නිලධාරි වසම් දෙකක සේවයේ නියුතු සමෘද්ධි සංවර්ධන නිලධාරීන් විසින් සමෘද්ධිලාභීන්ගේ නාමලේඛණය යාවත්කාලීන නොකිරීම නිසා 1995 සිට 2016 මාර්තු 21 දින දක්වා විහාරස්ථානයක හා පිරිවෙනක වැඩ වාසය නොකරන ලද ස්වාමීන් වහන්සේලාට සමෘද්ධි සහනාධාර ලෙස රු. 1,264,610 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මූලික විමර්ෂණයක් සිදුකර මුදල් අයකරගන්නා බව. | වැඩිපුර ගෙවූ මුදල් කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අස්වැසුම ප්‍රතිලාභීන් 47068 ක් තෝරා ගැනීමේ සමීක්ෂණ කටයුතු රජයේ නිලධාරීන් නොවූ බාහිර පුද්ගලයන් මගින් සිදු කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් එකතුව රු. 14,949,518 ක් ගෙවා තිබුණද, එම තෝරාගත් ප්‍රතිලාභීන්ගෙන් සියයට 51 ත් 87 ත් අතර ප්‍රමාණයක ප්‍රතිලාභීන් විසින් අස්වැසුම ප්‍රතිලාභ සම්බන්ධ අභියාචනා සහ විරෝධතා ඉදිරිපත් කිරීම නිසා අදාළ වියදම් අනාර්ථික වියදමක් වී තිබුණි. | සුහසාධක ප්‍රතිලාභීන් හඳුනා ගැනීමේ වැඩසටහනට අදාලව විරෝධතා හා අභියාචනා සම්බන්ධව පරීක්ෂණ සිදුකරමින් පවතින බව. | රජයේ මුදල් වඩාත් ඵලදායී ලෙස වියදම් කිරීමට බලධාරීන් අවධාරණය කරගත යුතුය. |
| (ඉ) | 2007 වසරේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් නිල නිවස ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.11,816,497ක් වැය කර තිබුණ ද එම නිල නිවස පසුගිය වසර 16 තුලම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | නිල නිවසේ කිසිවකු පදිංචි වී නොමැති බව. | රජයේ මුදල් අත්‍යවශ්‍ය වියදම් වෙනුවෙන් ආර්ථිකභාවයෙන් යුක්තව යෙදවීමට අවධාරණය කරගත යුතුය. |
| (ඊ) | දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු උපලේඛණගත නිවාසයක් 2022 වර්ෂයේදී රු.722,975 ක් වැයකර අලුත්වැඩියා කර මාස 15 ක් ගතවී තිබුණද නිල නිවස ඌණ උපයෝජිතව පැවතුණි. සහකාර ප්‍රාදේශීය ලේකම්වරියට පෞද්ගලික නිවසක් කුලී පදනමට ගෙන පදිංචි වී සිටි ඉහත කාලය තුළ රු. 300,000 ක නිල නිවාස දීමනාවක් ගෙවා තිබුණි. | මෙම නිල නිවසේ කිසිදු නිලධාරියෙක් පදිංචි විමට අකමැති බව. | නිලධාරින් වෙනුවෙන් වෙන්කළ රජයේ නිවසක් තිබියදී පෞද්ගලික කුලී නිවාසයක් සඳහා රජයේ මුදල් වැය නොකළ යුතුය. |
| (උ) | කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගතාර ග්‍රාම නිලධාරී වසමේ රජයට අයත් වැලිහේන්ගොඩ කුට්ටිය නම් ඉඩමෙහි පර්චස් 20 ක ඉඩම් කොටසක් 2004 වර්ෂයේදී හා විටියල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ රජයට අයත් හෙක්ටයාර 0.0365 ක් වූ ඉඩමක කොටසක් දූරකථන සමාගමක් විසින් අනවසරයෙන් අත්කරගෙන සම්ප්‍රේෂණ කුළුණු ඉදිකර තිබුණි. අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන | අනවසර අල්ලාගැනීම් සම්බන්ධව පනත ප්‍රකාරව කටයුතු නොකිරීම සම්බන්ධව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත කරුණු විමසා ලිපියක් යොමු කළ බව හා සහකාර ප්‍රාදේශීය ලේකම් ප්‍රමුඛ කමිටුව මගින් ලබා ගන්නා ලද දළ තක්සේරුව මත දූරකථන සමාගම වෙත බදු ගෙවන ලෙස දැනුම් දුන් බව. | අදාල සමාගමෙන් හිඟ බදු අය කර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතුය. |

නොතිබුණු අතර විගණිත දිනය වූ 2023 නොවැම්බර් 24 දින දක්වාත් අදාල සමාගමෙන් කිසිදු බදු මුදලක්ද අයකරගෙන නොතිබුණි.

## 4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ තිරසර සංවර්ධන සැලැස්ම හා ප්‍රගතිය තුල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වන අරමුණු 08 ක් හඳුනාගෙන තිබුණද, ඊට අදාලව චක්‍රලේඛය මගින් පෙන්වාදී තිබූ නිශ්චිත දර්ශක හඳුනාගෙන ඒවායේ ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. 2023 වර්ෂයේදී තිරසර සංවර්ධන අරමුණුවල ප්‍රගතිය මැනීම සඳහා දර්ශක යොදාගැනීම් පිළිබඳ තිරසර සංවර්ධන සභාවේ උපදෙස් අනුව කටයුතු කරන බව විගණනයට ඉකුත් වර්ෂයේදී වාර්තා කර තිබුණද, තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ වාර්ෂිකව ළඟාකර ගතයුතු අරමුණු හා ඉලක්කවල දර්ශක මට්ටම ඇගයීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | චක්‍රලේඛයේ පරිදි හැකිතාක් දුරට දර්ශක නිශ්චිතව ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව හා තිරසර සංවර්ධන සැලැස්මට අදාළව ප්‍රගතිය අර්ධ වාර්ෂික වශයෙන් ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරක හා තෘතීයික මට්ටමේ තනතුරු 02 ක පුරප්පාඩු 05 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 06ක පුරප්පාඩු 149 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරක පුරප්පාඩු 02ක් වශයෙන් මුළු පුරප්පාඩු 157ක් ද පැවතුණි. | පත්වීම් බලධරයා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් බැවින් එම අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම් සිදුකර පුරප්පාඩු පිරවිය යුතු බව. | පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තෘතීයික මට්ටමේ තනතුරක අතිරික්තයක්ද, ද්විතීයික මට්ටමේ තනතුරු 01 කට අයත් නිලධාරීන් 407 ක් හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 32 ක්ද සමග 440 ක අතිරික්තයක්ද විය. | පත්වීම් බලධරයා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් බැවින් එම අමාත්‍යාංශය මගින් බඳවා ගැනීම් සිදුකර පුරප්පාඩු පිරවිය යුතු බව. | අතිරික්තතා සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්ම සකස් කිරීමේ කටයුතු සිදුකරමින් පවතින බව. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කර වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කළ යුතුය. |
| (ඈ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව එකම ආයතනයක වසර 5කට වඩා වැඩි කාලයක් සේවයේ නියුතු නිලධාරීන් ස්ථාන මාරු කළ යුතු වුවද ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක තනතුරු 105 කට අයත් නිලධාරීන් 1031 ක් වර්ෂ 05ක සිට වර්ෂ 30 ක අතර කාල පරාසයක් එකම සේවා ස්ථානයේ සේවය කර තිබුණි. | එක් කාර්යාලයක වසර 05 ට වඩා වැඩි සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරු කිරීමට ඉදිරියේදී අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව. | චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළ යුතුය. |